(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

**අංක. 31.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0115/'09

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 01 යටතට ගැනෙන මොනරාගල, බදුල්ල, නුවරඑළිය, රත්නපුර යන දිස්ත්‍රික්කවල සමාජ සුබසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂයන්හිදී වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හි වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, මන්ද?

0240/'09

2.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රියාන්විත සේවයේ නියුතු රණවිරුවන්ට ගෙවනු ලබන දීමනාව 2009 අයවැය මගින් රුපියල් 3000 සිට රුපියල් 5000 දක්වා වැඩි කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩි කළ මුදල රණවිරුවන්ට ලබාදෙන්නේද;

(ii) එසේනම් ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් මුදල ලැබීමට හිමිකම් ලබන රණවිරුවන්ගේ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0281/'09

3.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද අඹේපුස්ස ගල්වල ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් පුපුරන ද්‍රව්‍ය තොගයක් පාවිච්චියට ගත නොහැකිව විනාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) විනාශකර ඇති එම පුපුරන ද්‍රව්‍ය තොගයේ මූල්‍යමය වටිනාකම හා එකී ද්‍රව්‍ය විනාශ කළ දිනය කවරේද;

(ii) එවැනි තොගයක් මිලදී ගැනීමට හා පසුව පාවිච්චියට නොගෙන විනාශ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/'09

4.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 ජනවාරි මස 01 වැනිදා සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා කාලය තුළ—

(i) ලබාගත් මුළු ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය කොපමණද;

(ii) ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම කොපමණද;

(iii) ආනයන අනුපාතයට සාපේක්ෂව සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) දරිද්‍රතා මට්ටම කොපමණද;

(v) දරිද්‍රතා මට්ටමට අඩුවෙන් උපයන පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) ගෙවුම් ශේෂය කොපමණද;

(vii) සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) - (vii) අනුව, රට ප්‍රගතියක් අත්කරගෙන තිබේද, නැතහොත් පිරිහී තිබේද යන්න සාක්ෂි සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'09

5.

ගරු රේණුකා හේරත් මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම තනතුරු දරන අයගේ නම් සහ අදාළ රාජකාරි ලැයිස්තු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැනට පුරප්පාඩු පවතින තනතුරු හා එම පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(ii) එම තනතුරුවල රාජකාරි කටයුතු පවත්වාගෙන යන්නේ කෙසේද;

(iii) පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කරන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0482/'09

6\.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වසර තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් රජයේ වියදමින් විදේශ සංචාර සඳහා සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඒ කවර රටවලටද;

(iii) එසේ සහභාගි වූයේ කවර අරමුණක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා වයස වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද;

(ඇ) එම සංචාර සඳහා දරන ලද මුළු වියදම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0485/'09

7\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ඇති නිල වාහන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මණ්ඩලය විසින් එහි ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ පරිහරණය පිණිස බාහිර හා පෞද්ගලික ආයතනවලින් කුලී පදනම මත වාහන ලබාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල වර්ගය හා අංක කවරේද;

(iii) මෙම වාහන පරිහරණය කරන නිලධාරීන් කවුරුන්ද;

(iv) මෙම වාහන ලබාගෙන ඇති ආයතන හෝ පෞද්ගලික හිමිකරුවන් කවුරුන්ද;

(v) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) මෙම වාහන වෙනුවෙන් මාසිකව ගෙවන ලද කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) පසුගිය 2008 ජනවාරි මස සිට මේ දක්වා එක් එක් වාහනය ධාවනය කළ දුර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා ගෙවා ඇති මුදල කොපමණද;

(iii) මෙම වාහන ගාල්කර තබන ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0491 /09

8\.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර වත්කම් හි ආයෝජනය කරන ලෙස 2009 ජනවාරි මස 01 වැනි දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වශයෙන් මෙන්ම අතිගරු ජනාධිපතිතුමා වශයෙන් විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයින්ගෙන් හා සංක්‍රමික ශ්‍රමිකයින් වශයෙන් රැකියාවල නිරත වූවන්ගෙන් ඉල්ලා සිටින ලද ලිපියට අනුව, මේ වනවිට කොපමණ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාවක් මෙම ආයෝජන අවස්ථා සඳහා ලියාපදිංචි වී තිබේද;

(ii) එය දැනට විදේශයන්හි පදිංචි හා සංක්‍රමික රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින්ගෙන් කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ඒ අනුව භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙන් මෙරටට ලැබී ඇති විදේශ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) භාණ්ඩාගාර බැඳුම්කරයන්හි කරන ලද ආයෝජනයන්ගෙන් ලැබී ඇති විදේශ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0241/'09

9.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමියගෙන් ඇසීමට,—(1)

(අ) (i) "කැපකරු දෙගුරු" වැඩසටහන යටතේ ලංකාවේ දරුවන් කොපමණ සංඛ්‍යාවකට ආධාර මුදල් ලබා දෙන්නේද;

(ii) එක් දරුවෙකුට ලබාදෙන මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමය" වැඩසටහන යටතේ ලංකාවේ දරුවන් කොපමණ සංඛ්‍යාවකට අධාර මුදල් ලබාදෙන්නේද;

(ii) එක් දරුවෙකුට ලබාදෙන මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතීන් ව්‍යාප්ත කිරීමට මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

(ii) 2008 වසරේදී "කැපකරු දෙගුරු" වැඩසටහනට සහ "සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමය" වැඩසටහනට අලුතෙන් දරුවන් කොපමණ සංඛ්‍යාවක් සම්බන්ධ කර ගෙන තිබේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0390/'09

10.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2007 ජනවාරි 01 වැනි දින වන විට, 2008 ජනවාරි 01 වැනි දින වන විට, 2009 ජනවාරි 01 වැනි දින වන විට සහ අද වන විට —

(i) පාබල හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ සහ පොලිසියේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) පිරිමි සාමාජිකයන් සංඛ්‍යාව සහ කාන්තා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 ජනවාරි මස 01 වැනි දින වනවිට සහ 2009 මැයි මස 17 වැනි දිනට පසු මෙම වීරෝදාර හමුදා සාමාජිකයන්හට ලබා දුන් අමතර ප්‍රතිලාභ කවරේද;

(ii) 2008 වසරේදී සහ 2009 වසරේ මේ දක්වා කාලය තුළ සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන්හට ඉදිකර ලබා දුන් නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිවාස ලබා දෙන ලද්දේ මුදල් අයකිරීමකින් තොරවද;

(iv) නොඑසේ නම්, මුදල් ගෙවීමට අදාළ කොන්දේසි කවරේද; සහ

(v) මෙම නිවාස ප්‍රතිලාභ ලැබුණු විරෝදාර හමුදා සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0484/’09

11.
ගරු වයි.එම්. නවරත්න බණ්ඩා මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2009 වර්ෂයේ මේ දක්වා “ඩෙංගු” රෝගය වැළඳුන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලසීමාව තුළදී මියගිය රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අදාළ කාලසීමාව තුළ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව අඩු හෝ වැඩිවීමට බලපාන ලද විශේෂ හේතු හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඩෙංගු රෝගය සම්පූර්ණයෙන් මර්ධනය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ගනුලැබූ පියවර කවරේද;

(ii) “ඩෙංගු” මර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවර රටවලින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0486/’09

12.
ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) දැනට සේවය කරන අර්ථසාධක අරමුදලට දායකවන සේවක මහත්ම මහත්මීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයින් උපයා ගන්නා අර්ථසාධක අරමුදලින් කිසියම් මුදලක් පොලිය වශයෙන් ගෙවන්නේද;

(iii) 2007 – 2008 වර්ෂවල එසේ ගෙවා ඇති පොලී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම වර්ෂවල එසේ පොලී ගෙවීම අත්හිටුවා ඇත්නම් ඒ කවර හේතූන් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කිසියම් නිලධාරියෙකු විසින් අත්තනෝමතික අයුරින් මෙම අර්ථසාධක අරමුදල් පොලිය ගෙවීම අත්හිටුවා තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) වැඩකරන ජන කොට්ඨාසයකට අහිමි වූ මෙම මුදල නැවත ලබාදීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'09

13.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 73 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) සඳහන්, ''සෙංකඩගල නවෝදය'' වැඩසටහන යටතේ යෝජනා කර ඇති පරිදි, උඩරට ජනතාව අතර ඇති පාරම්පරික කර්මාන්ත වැඩිදියුණු කිරීම ආරම්භ කර තිබේද;

(ii) ඒ අනුව හඳුනාගෙන ඇති පාරම්පරික කර්මාන්ත වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සෙංකඩගල ප්‍රදේශයේ විශේෂිත සම්පත් ආශ්‍රිතව වැඩි දියුණු කිරීමට හඳුනාගෙන ඇති කර්මාන්ත කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0244/'09

14.

ගරු ජෙමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාලය තුළ ඇමෙරිකා එක්සත් ජනපදයේ පුරවැසිභාවය හිමි වූ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ගේ නම් හා ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එකී ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට ඉහත එම රටේ පුරවැසිභාවය හිමිවූයේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0487/'09

15.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුදල් අධ්‍යක්ෂවරයා විසින් එම ආයතනයේ සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් පෞද්ගලික, නීති විරෝධි ආයතනයක තැන්පත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම නීති විරෝධී මූල්‍ය ආයතනය කවරේද;

(ii) එහි තැන්පත්කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල තැන්පත් කළේ කවදාද;

(iv) එදින සිට මේ දක්වා ලබාගත් පොලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සෙලාන් සෙකියුරිටි ඇන්ඩ් ෆිනෑන්ස් ප්‍රයිවට් ආයතනයේ තැන්පත්කර ඇති මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මෙම ආයතනයෙන් ලැබෙන පොලිය මුදල් අධ්‍යක්ෂවරයා විසින් තමන්ගේ පෞද්ගලික ගිණුමට බැර කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 1.30 දක්වා විය යුතු ය. අ. භා. 12.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2009 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*3.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*10.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*12.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*13.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*19.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*26.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

27.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

30.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

ග්‍රාමීය සේවක සහ අනුබද්ධිත ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---